# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2022 අංක 10 දරන කම්කරු වන්දි (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2022 මාර්තු මස 19 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---


2022 මාර්තු මස 25 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකි ය.

**මිල :** රු. 18.00 | **තැපැල් ගාස්තුව :** රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2022 අංක 10 දරන කම්කරු වන්දි (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2022 මාර්තු මස 19 වන දින]

එල්.ඩී.—ඕ. 62/2018

## (139 වන අධිකාරය වූ) කම්කරු වන්දි ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2022 අංක 10 දරන කම්කරු වන්දි (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) (139 වන අධිකාරය වූ) කම්කරු වන්දි ආඥාපනතේ දීර්ඝ නාමය එහි "සේවයේ යෙදී සිටිය දී තුවාල ලැබූ" යන වචන වෙනුවට "සේවයේ යෙදී සිටිය දී හෝ නේවාසික ස්ථානයේ සිට සේවා ස්ථානය වෙත පැමිණෙන අතරතුර හෝ සේවා ස්ථානයේ සිට නේවාසික ස්ථානය වෙත ආපසු පැමිණෙන අතරතුර තුවාල ලැබූ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. 139 වන අධිකාරයේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය, එහි "අසම්පූර්ණ අබලතාව" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම

> " "නේවාසික ස්ථානය" යන්නට කම්කරුවකුගේ යම් ස්ථිර නේවාසික ස්ථානයක් හෝ සේවා ස්ථානය වෙත පැමිණීමේ කාර්යය සඳහා යම් කම්කරුවකු තාවකාලිකව වාසය කරන නවාතැන්පොළක් හෝ වෙනත් යම් ස්ථානයක් ඇතුළත් වේ;".

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය, එහි "සේවයේ යෙදී සිටිය දී" යන වචන වෙනුවට "සේවයේ යෙදී සිටිය දී හෝ නේවාසික ස්ථානයේ සිට සේවා ස්ථානය වෙත පැමිණෙන අතරතුර හෝ සේවා ස්ථානයේ සිට නේවාසික ස්ථානය වෙත ආපසු පැමිණෙන අතරතුර" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය, එහි "සේවයේ යෙදී සිටිය දී" යන වචන වෙනුවට "සේවයේ යෙදී සිටිය දී හෝ නේවාසික ස්ථානයේ සිට සේවා ස්ථානය වෙත පැමිණෙන අතරතුර හෝ සේවා ස්ථානයේ සිට නේවාසික ස්ථානය වෙත ආපසු පැමිණෙන අතරතුර" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය, එහි "සේවයේ යෙදී සිටිය දී හෝ සේවය නිසාම ඇති වූ තුවාලයක්" යන වචන වෙනුවට "සේවයේ යෙදී සිටිය දී හෝ සේවය නිසාම ඇති වූ ද, නැතහොත් නේවාසික ස්ථානයේ සිට සේවා ස්ථානය වෙත පැමිණෙන අතරතුර හෝ සේවා ස්ථානයේ සිට නේවාසික ස්ථානය වෙත ආපසු පැමිණෙන අතරතුර සිදු වූ අනතුරකින් සිදු වූ තුවාලයක්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 6අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 6අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

"වන්දි මුදල ගණනය කිරීමේ දී රැකියාවේ ස්වභාවය සලකා බැලිය යුතු බව

6අ. 6 වන වගන්තියේ කුමක් සඳහන්ව ඇත ද, ඒ නොතකා, ස්ථිර හෝ අසම්පූර්ණ අබලතාවක් සිදු වූ අවස්ථාවක, යම් තුවාලයක් සම්බන්ධයෙන් වන්දි මුදල ගණනය කිරීමේ දී කම්කරුවකුගේ රැකියාවේ ස්වභාවය සලකා බැලිය යුතු ය. එම වන්දිය, අදාළ වෛද්‍යවරයා විසින් නිකුත් කරනු ලබන වෛද්‍ය වාර්තාව මත පදනම් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 7 වන වගන්තිය සංශෝධනය කිරීම

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ඈ) දෛනික වැටුප් ලබන හෝ කෑලි පදනම මත වේතන ලබන කම්කරුවකු සම්බන්ධයෙන් වන විට, අනතුර සිදුවීමට පෙරාතුව ම එම කම්කරුවා සේවයේ යෙදී සිටි අවසාන මාස දොළහ සඳහා ලබාගත් දෛනික වැටුපෙන් හෝ කෑලි පදනම මත වේතනයෙන් ඉපැයූ මුදල් ප්‍රමාණය, දොළහෙන් බෙදා එය නැවත විසිපහෙන් බෙදා ලැබෙන එකතුව එම කම්කරුවාගේ මාසික වේතනය විය යුතු ය.".

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ අතුරු විධානයේ "එකතුව රුපියල් දස දහසක් නොඉක්මවන මුදලක්" යන වචන වෙනුවට "එකතුව රුපියල් විසි දහසක් නොඉක්මවන මුදලක්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය, එහි (1) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම

"(1) 11 වන වගන්තිය යටතේ, මිය ගිය කම්කරුවකු සම්බන්ධයෙන් වන්දියක් ලෙස යම් මුදලක් තැන්පත් කිරීමේ දී, කොමසාරිස්වරයා විසින්, කම්කරුවාගේ අවමංගල්‍ය කෘත්‍යය වෙනුවෙන් සැබවින්ම වැය වූ මුදල් ලෙස රුපියල් ලක්ෂයක් නොඉක්මවන මුදලක්, එයින් අඩු කර ඒ වියදම දරනු ලැබුවේ යම් තැනැත්තකු විසින් ද, ඒ තැනැත්තා වෙත එම මුදල ගෙවනු ලැබිය යුතු ය.

(1අ) මිය ගිය කම්කරුවාගේ වන්දිය බෙදා දීම තීරණය කිරීම සඳහා, කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබිය හැකි දිනයක දී ඔහු ඉදිරියේ පෙනී සිටීම සඳහා ඉල්ලීමක් කරමින් කොමසාරිස්වරයා විසින් මිය ගිය කම්කරුවාගේ ශ්‍රී ලංකාවේ නේවාසික එක් එක් යැපෙන්නා වෙත දැන්වීමක් භාරදීමට කටයුතු සැලැස්විය යුතු ය. කොමසාරිස්වරයා විසින් අවශ්‍ය යැයි සලකනු ලැබිය හැකි යම් පරීක්ෂණයකින් පසු, කිසිදු යැපෙන්නකු නොසිටින බවට ඔහු සෑහීමට පත්වන්නේ නම්, කොමසාරිස්වරයා විසින් එහි ශේෂ මුදල, වන්දිය ගෙවනු ලැබුවේ යම් සේවායෝජකයකු විසින් ද, එම සේවායෝජකයාට ආපසු ගෙවනු ලැබිය යුතු ය. එසේ වුව ද, 11 වන වගන්තිය යටතේ මුදල් තැන්පත් කරනු ලැබූ දින සිට ගණන් ගනු ලබන මාස දොළහක කාලසීමාවක් ඉකුත්වන තෙක් එවැනි කිසිදු ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබිය යුතු ය. සේවායෝජකයා විසින් කරන ලද ඉල්ලීමක් මත, කොමසාරිස්වරයා විසින්, සිදු කරන ලද සියලු විය පැහැදම් පිළිබඳ එකඟතා ප්‍රකාශයක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.".

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "හදිසි අනතුර සිදුවී හෝ මරණයෙන් කෙළවර වී නම් මරණය සිදුවී හෝ අවුරුදු දෙකක් ගත වන්නට කලින්" යන වචන වෙනුවට "හදිසි අනතුර සිදුවී අවුරුදු දෙකක් ඇතුළත හෝ මරණයෙන් කෙළවර වී නම්, මරණය සිදුවී අවුරුදු දෙකක් ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (2) වන උපවගන්තියේ "රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට" යන වචන වෙනුවට "රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට" යන වචන ආදේශ කිරීමෙන්;

(2) (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

"(3) සෑම සේවායෝජකයකු විසින්ම, (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති දැන්වීම් පොතට අමතරව, යම් කර්මාන්ත ශාලාවක හෝ යම් සේවා ස්ථානයක සිදුවන යම් හදිසි අනතුරක් පිළිබඳ තොරතුරු සහ විස්තර ඇතුළත් කරනු ලබන වාර්තා පොතක් පවත්වාගෙන යනු ලැබිය යුතු ය. තව ද, සේවායෝජකයා විසින් එම වාර්තා පොත භාරව කටයුතු කිරීම සඳහා වගකිවයුතු තැනැත්තකු පත්කරනු ලැබිය යුතු ය. කොමසාරිස්වරයාට එම වාර්තා පොත වෙත ප්‍රවේශ විය හැකි අතර, පරීක්ෂා කිරීම සඳහා එහි උධෘත හෝ පිටපත් ඔහු විසින් ඉල්ලා සිටිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ "සේවයේ යෙදී සිටියදී" යන වචන වෙනුවට, "සේවයේ යෙදී සිටිය දී හෝ නේවාසික ස්ථානයේ සිට සේවා ස්ථානය වෙත පැමිණෙන අතරතුර හෝ සේවා ස්ථානයේ සිට නේවාසික ස්ථානය වෙත ආපසු පැමිණෙන අතරතුර" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

"(5) මිය ගිය කම්කරුවාගේ අවමංගල්‍ය වියදම වශයෙන් සේවායෝජකයා විසින් ගෙවිය යුතු රුපියල්

පනස් දහසක් නොඉක්මවන මුදලක් කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි ය. එම මුදල සේවායෝජකයා විසින් ගෙවිය යුතු වන්දියට අමතරව විය යුතු අතර, අදාළ සේවායෝජකයා විසින් කොමසාරිස්වරයාගේ හෝ එම කම්කරුවාගේ ළඟම ඥාතියාගේ ගිණුමේ තැන්පත් කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 23අ වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"නියමිත දිනට වන්දි ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් සේවායෝජකයාට අධිභාර නියම කිරීම

23අ. මේ පනත යටතේ, අවස්ථාවෝචිත පරිදි, කම්කරුවකුට හෝ ඔහුගේ උරුමකරුවන්ට වන්දියක් වශයෙන් ගෙවිය යුතු යම් මුදලක් ගෙවීමට යටත් වන යම් සේවායෝජකයකු විසින්, නියමිත දිනයේ දී හෝ එදිනට පෙර එම මුදල ගෙවීමට අපොහොසත් වන විට හෝ ගෙවීම පැහැර හරින විට, ඔහු විසින් වන්දිය වශයෙන් ගෙවිය යුතු මුදලට අමතරව එම මුදල මත පහත දැක්වෙන ආකාරයට ගණනය කරන ලද අධිභාරයක්, අවස්ථාවෝචිත පරිදි, එම කම්කරුවාට හෝ ඔහුගේ උරුමකරුවන්ට ගෙවීමට යටත් විය යුතු ය:-

(අ) වන්දි ගෙවීම, නියමිත දින සිට එක් මාසයක් නොඉක්මවන කාලසීමාවක් සඳහා හිඟව ඇති විට, වන්දිය වශයෙන් ගෙවිය යුතු මුදලින් සියයට දහයක අධිභාරයක්;

(ආ) වන්දි ගෙවීම, නියමිත දින සිට එක් මාසයක් ඉක්මවන එහෙත් මාස තුනක් නොඉක්මවන කාලසීමාවක් සඳහා හිඟව ඇති විට, වන්දිය වශයෙන් ගෙවිය යුතු මුදලින් සියයට පහළොවක අධිභාරයක්;

(ඇ) වන්දි ගෙවීම, නියමිත දින සිට මාස තුනක් ඉක්මවන එහෙත් මාස හයක් නොඉක්මවන කාලසීමාවක් සඳහා හිඟව ඇති විට, වන්දිය වශයෙන් ගෙවිය යුතු මුදලින් සියයට විස්සක අධිභාරයක්;

(ඇ) වන්දි ගෙවීම, නියමිත දින සිට මාස හයක් ඉක්මවන එහෙත් මාස දොළහක් නොඉක්මවන කාලසීමාවක් සඳහා හිඟව ඇති විට, වන්දිය වශයෙන් ගෙවිය යුතු මුදලින් සියයට විසි පහක අධිභාරයක්; හෝ

(ඉ) වන්දි ගෙවීම, නියමිත දින සිට මාස දොළහක් ඉක්මවන කාලසීමාවක් සඳහා හිඟව ඇති විට, වන්දිය වශයෙන් ගෙවිය යුතු මුදලින් සියයට තිහක අධිභාරයක්.".

ප්‍රධාන ප්‍රඥප්තියට 27අ වන වගන්තිය ඇතුළත් කිරීම

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 27අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

"රෙජිස්ට්‍රාර්වරයකු පත්කිරීම

27අ. මේ පනතේ කාර්ය සඳහා, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කම්කරු වන්දි පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයකු පත් කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය සංශෝධනය කිරීම

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය, එහි (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් මුදලක්, එම උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට අයකර ගත නොහැකි වේ නම්, ගෙවීම පැහැරහරින්නාගේ නිශ්චල දේපළ තහනමට ගැනීමෙන් හෝ විකිණීමෙන් එම මුදල අයකර ගැනීම සඳහා කොමසාරිස්වරයා විසින් නියමයක් කරනු ලැබිය හැකි ය. 27අ වන වගන්තිය යටතේ පත්කරන ලද කම්කරු වන්දි පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා විසින්, එම පැහැරහරින්නා වාසය කරන අධිකරණ බල ප්‍රදේශයේ අදාළ දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා මඟින් එම නියමය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය. අධිකරණයක් විසින් නිකුත් කරන ලද රිට් ආඥාවක් ක්‍රියාත්මක කිරීමේ දී, පිස්කල් විසින් නිශ්චල දේපළ තහනමට ගැනීම සහ විකිණීම සහ ඔහු විසින් තහනමට ගන්නා ලද යම් නිශ්චල දේපළක් සම්බන්ධයෙන් වන හිමිකම් කියා පෑම් ඉදිරිපත් කිරීම හා විනිශ්චය කිරීම සම්බන්ධයෙන් අදාළ වන, (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන, මෙම

වගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් කරන ලද කොමසාරිස්වරයාගේ නියමයේ නිශ්චිතව දක්වා ඇති මුදල් ප්‍රමාණය අයකර ගැනීම සඳහා නිශ්චල දේපළ තහනමට ගැනීම සහ විකිණීම සම්බන්ධයෙන් ද, එම මුදල් ප්‍රමාණය අය කර ගැනීම සඳහා තහනමට ගන්නා ලද නිශ්චල දේපළ පිළිබඳ හිමිකම් කියා පෑම් ඉදිරිපත් කිරීම හා විනිශ්චය කිරීම සම්බන්ධයෙන් ද අදාළ වන්නේ ය. එම විධිවිධාන අදාළ කරගැනීමේ කාර්යය සඳහා, එසේ නිශ්චිතව දක්වා ඇති මුදල, අධිකරණය විසින් එළඹෙන ලද තීන්දු ප්‍රකාශයක් මත ලැබිය යුතු බවට සලකනු ලැබිය යුතු මෙන්ම, කොමසාරිස්වරයා විනිශ්චිත-ණය හිමියා ලෙස සලකනු ලැබිය යුතු අතර, එම මුදල ගෙවීමට යටත් වන තැනැත්තා විනිශ්චිත-ණයකරුවකු ලෙස සලකනු ලැබිය යුතු ය.”.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය, එහි “වංචාවකින්, අනිසි බලපෑමකින් හෝ වෙනත් අයුතු ක්‍රමවලින්” යන වචන වෙනුවට “වංචාවකින්, අනිසි බලපෑමකින් හෝ වෙනත් අයුතු ක්‍රමවලින් හෝ එකඟතා ගිවිසුම යටතේ කම්කරුවාට ගෙවිය යුතු වන්දි මුදල වැරදි ලෙස ගණනය කිරීමේ හෝ අඩුවෙන් තක්සේරු කිරීමේ හේතුවෙන්” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය සංශෝධනය කිරීම

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ “රුපියල් දහසක් නොඉක්මවන දඩයකට” යන වචන වෙනුවට “රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය සංශෝධනය කිරීම

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය, එහි “රුපියල් සියයක් නොඉක්මවන දඩයකට” යන වචන වෙනුවට “රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ “රුපියල් සියයක වටිනාකමකින්” යන වචන වෙනුවට “රුපියල් දෙදහසක වටිනාකමකින්” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය සංශෝධනය කිරීම

ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය, එහි "අභියාචනාධිකරණය" යන වචන වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය සංශෝධනය කිරීම

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය, එහි "අභියාචනාධිකරණය විසින්" යන වචන වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණය විසින්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තිය සංශෝධනය කිරීම

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "සේවයේ යෙදී සිටිය දී සිදු වූ" යන වචන වෙනුවට "සේවයේ යෙදී සිටිය දී හෝ නේවාසික ස්ථානයේ සිට සේවා ස්ථානය වෙත පැමිණෙන අතරතුර හෝ සේවා ස්ථානයේ සිට නේවාසික ස්ථානය වෙත ආපසු පැමිණෙන අතරතුර සිදු වූ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තිය සංශෝධනය කිරීම

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තිය, එහි "සේවයේ යෙදී සිටිය දී සිදු වූ" යන වචන වෙනුවට "සේවයේ යෙදී සිටිය දී හෝ නේවාසික ස්ථානයේ සිට සේවා ස්ථානය වෙත පැමිණෙන අතරතුර හෝ සේවා ස්ථානයේ සිට නේවාසික ස්ථානය වෙත ආපසු පැමිණෙන අතරතුර සිදු වූ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 60අ වන වගන්තිය සංශෝධනය කිරීම

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 60අ වන වගන්තිය, එහි "සේවයේ යෙදී සිටිය දී සිදු වූ" යන වචන වෙනුවට "සේවයේ යෙදී සිටිය දී හෝ නේවාසික ස්ථානයේ සිට සේවා ස්ථානය වෙත පැමිණෙන අතරතුර හෝ සේවා ස්ථානයේ සිට නේවාසික ස්ථානය වෙත ආපසු පැමිණෙන අතරතුර සිදු වූ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ I වන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ I වන උපලේඛනය මෙයින් ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ:-

“I වන උපලේඛනය

(2 වන වගන්තිය)

ස්ථිර/අසම්පූර්ණ අබලතාවක් සිදුකෙරේ යැයි සලකනු ලබන තුවාල ලැයිස්තුව

| තුවාලය | ඉපැයීමේ හැකියාව නැතිවීමේ ප්‍රතිශතය |
|---|---|
| ස්ථිර වශයෙන් ම ඔත්පලවීමක් සිදුකෙරෙන, ස්ථිර වූ ද, අසාධ්‍ය වූ ද අවයව පක්ෂාඝාතය හෝ තුවාල | 100 |
| වැඩ කිරීමේ පූර්ණ අශක්නුතාව සිදුකෙරෙන, ස්ථිර, සුව කළ නොහැකි මානසික ශක්තිය නැතිවීම හෝ වැඩ කිරීමේ පූර්ණ අශක්නුතාවට හේතුවන වෙනත් යම් තුවාලයක් | 100 |
| ඇසේ තුවාල | |
| (i) ඇස් දෙකේ පෙනීම මුළුමනින් ම නැතිවීම | 100 |
| (ii) එක් ඇසක පෙනීම මුළුමනින් ම නැතිවීම | 80 |
| ශ්‍රවණ ආබාධ | |
| (i) ශ්‍රවණය මුළුමනින් ම නැතිවීම | 80 |
| (ii) එක් කණක ශ්‍රවණය මුළුමනින් ම නැතිවීම | 50 |
| කථනය නැතිවීම | |
| (i) කථනය මුළුමනින් ම නැතිවීම | 100 |
| ඉන්ද්‍රියයන් නැතිවීම | |
| (i) ගන්ධය හා රසය දැනෙන ඉන්ද්‍රියයන් මුළුමනින් ම නැතිවීම | 60 |
| (ii) ගන්ධය දැනෙන ඉන්ද්‍රියයන් මුළුමනින් ම නැතිවීම | 60 |
| (iii) රසය දැනෙන ඉන්ද්‍රියයන් මුළුමනින් ම නැතිවීම | 60 |
| බාහුවේ තුවාල | |
| (i) වැලමිටෙන් හෝ ඊට ඉහළින් බාහුව නැතිවීම | 85 |
| (ii) වැලමිටෙන් හෝ ඊට පහළින් බාහුව නැතිවීම | 80 |
| අත්වල තුවාල | |
| (i) අත් දෙක ම නැතිවීම | 100 |
| (ii) අතක් හෝ මාපට ඇඟිල්ලක් සහ ඇඟිලි හතරක් නැතිවීම | 80 |
| (iii) මාපට ඇඟිල්ලක් (ඇඟිලි පුරුක් දෙකම) නැතිවීම | 50 |
| (iv) මාපට ඇඟිල්ලක් (එක් ඇඟිලි පුරුකක්) නැතිවීම | 40 |
| (v) ඇඟිලි හතරක් නැතිවීම | 80 |

| | |
|---|---|
| දබරැඟිල්ල නැතිවීම | |
| (i) ඇඟිලි පුරුක් තුනක් | 50 |
| (ii) ඇඟිලි පුරුක් දෙකක් | 40 |
| (iii) එක් ඇඟිලි පුරුකක් | 20 |
| මැදැඟිල්ල, වෙදැඟිල්ල සහ සුළැඟිල්ල නැති වීම | |
| (i) ඇඟිලි පුරුක් තුනක් | 30 |
| (ii) ඇඟිලි පුරුක් දෙකක් | 20 |
| (iii) එක් ඇඟිලි පුරුකක් | 15 |
| කකුල නැතිවීම | |
| (i) දණහිසින් හෝ ඉන් ඉහළට | 90 |
| (ii) දණහිසින් හෝ ඉන් පහළට | 80 |
| පාදවල තුවාල | |
| (i) දෙපා නැතිවීම | 100 |
| (ii) එක් පාදයක් නැතිවීම | 90 |
| පා ඇඟිලි නැතිවීම | |
| (i) මාපට ඇඟිල්ල - ඇඟිලි පුරුක් දෙකම | 40 |
| (ii) මාපට ඇඟිල්ල - එක් ඇඟිලි පුරුකක් | 20 |
| (iii) මාපට ඇඟිල්ල නොවන එකකට වැඩි ඇඟිලි ගණනක් නැතිවුවහොත්, එක් එක් ඇඟිල්ල සඳහා | 20 |
| විවිධ | |
| (i) ජනනේන්ද්‍රියයන් මුළුමනින් ම නැතිවීම | 75 |
| (ii) ජනනේන්ද්‍රියක කොටසක් නැතිවීම | 60 |
| (iii) මුහුණේ බරපතල කැළැල් ඇතිවීම හෝ මුහුණ විරූපී වීම | 90 |
| (iv) මුහුණේ කැළැල් ඇතිවීම හෝ මුහුණ විරූපී වීම නොවන, බරපතල ලෙස ශරීරය විරූපී වීම - උපරිමය | 60 |
| (v) එක් දතක් නැතිවීම | 10 |
| (vi) වෛද්‍ය නිලධරයකු විසින් තක්සේරු කරනු ලැබිය යුතු ඉහත සඳහන් නොකරන ලද යම් අවයවයක් හෝ ඉන් යම් කොටසක් (උදා- නාසය, ළපැත්ත, කණ ආදිය නැතිවීම) - උපරිමය.”. | 60 |

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන උපලේඛනය මෙයින් ඉවත්කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම

"IV වන උපලේඛනය

(6 වන වගන්තිය)

ගෙවිය යුතු වන්දි මුදල

| තුවාල ලත් කම්කරුවාගේ මාසික වේතනය | | කම්කරුවාගේ මරණය | කම්කරුවාගේ ස්ථිර අබලතාව | කම්කරුවා තාවකාලිකව අබලතාවට පත්වීම වෙනුවෙන් වන්දි වශයෙන් අර්ධ මාසික ගෙවීම |
|---|---|---|---|---|
| රු. | රු. | රු. | රු. | රු. |
| 0 | 10,000 | 1,140,000 | 1,200,000 | 5,000 |
| 10,001 | 12,500 | 1,180,000 | 1,240,000 | 5,625 |
| 12,501 | 15,000 | 1,220,000 | 1,280,000 | 6,875 |
| 15,001 | 17,500 | 1,260,000 | 1,320,000 | 8,125 |
| 17,501 | 20,000 | 1,300,000 | 1,360,000 | 9,375 |
| 20,001 | 22,500 | 1,340,000 | 1,400,000 | 10,625 |
| 22,501 | 25,000 | 1,380,000 | 1,440,000 | 11,875 |
| 25,001 | 27,500 | 1,420,000 | 1,480,000 | 13,125 |
| 27,501 | 30,000 | 1,460,000 | 1,520,000 | 14,375 |
| 30,001 | 35,000 | 1,510,000 | 1,570,000 | 16,250 |
| 35,001 | 40,000 | 1,560,000 | 1,630,000 | 18,750 |
| 40,001 | 45,000 | 1,610,000 | 1,680,000 | 21,250 |
| 45,001 | 50,000 | 1,660,000 | 1,730,000 | 23,750 |
| 50,001 | 55,000 | 1,710,000 | 1,780,000 | 26,250 |
| 55,001 | 60,000 | 1,760,000 | 1,830,000 | 28,750 |
| 60,001 | 70,000 | 1,820,000 | 1,890,000 | 32,500 |
| 70,001 | 80,000 | 1,880,000 | 1,960,000 | 37,500 |
| 80,001 | 90,000 | 1,940,000 | 2,000,000 | 42,500 |
| 90,001 | 100,000 | 2,000,000 | 2,000,000 | 47,500 |
| 100,000 | සහ ඊට වඩා වැඩි මුදලක් | 2,000,000 | 2,000,000 | 47,500 |

.".

**28.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.